1205

01.
මගේ අංකය -032/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය.
නීලබැම්ම ව්‍යාපාරය.
සාලියවැව හංදිය.
2019.02.15

14 MAR 2019

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම/මහත්මීන් වෙත.

## ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්ථාව - නීලබැම්ම ව්‍යාපාරය.

## 2019.02.14

1968 අංක 48 දරණ හා 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධිත)පනත අනුව 2019.02.14 වන දින පෙ.ව 09.30 ට මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසු මියගිය රණවිරුවන්, ගොවි නායකයින් හා සාමාජිකයින් සිහි කිරිමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි.

**සහාභාගි වු රාජ්‍ය නිලධාරින්.**

| | නම | තනතුර |
|---|---|---|
| 01 | එච්.එම්. දිසානායක මහතා. | නේවාසික ව්‍යාපාර කළමනාකරු. |
| 02 | කේ.ජ්.එල්.ප්‍රියදර්ශණි මිය. | ගොවිජන සංවර්ධන නිලධාරි. |
| 03 | ඩී.ඩී.එම්.රත්නායක මිය. | ඉංජිනේරු සහකාර. |
| 04 | එම්.ආර්. අයි. අබේරත්න මහතා | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක. |
| 05 | ආර්.සි.එස්.කේ.සෙනෙවිරත්න මහතා | සංවර්ධන නිලධාරි. |
| 06 | ඩි.සි.එස් කුලරත්න මහතා. | තාක්ෂණ සහාකාර කෘෂි ව්‍යාප්ති. |
| 07 | ආර්.එල්.එල්.ජයසුරිය මහතා. | තාක්ෂණ සහාකාර කෘෂි ව්‍යාප්ති. |
| 08 | ඩී.ඩබ්.ගයාන් රවිත සමරවීර මහතා. | පොල් සංවර්ධන නිලධාරි. |
| 09 | ටී.එම්.පි.ටී.බංඩාර මහතතා. | කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහාකාර. |

**සහාභාගි වු ගොවි නියෝජිතයින්.**

| | නම | ගොවි සංවිධානය | තනතුර |
|---|---|---|---|
| 01 | ඩී.එම්.සෙනෙවිරත්න මහතා | නීලවැලි | ලේකම්/ඒ.බ.ගො.සභාපති |
| 02 | ඩබ්.ටී.එම්.කපුරුබංඩා මහතා | වෙහෙරබැදි | සභාපති |
| 03 | පි.ඩී.ජේ.පතිරාජ මහතා | නවෝදය | ලේකම්/ඒ.බ.ගො.ලේකම් |
| 04 | පි.ලක්ෂ්මී මිය | නීලමහා | ණය.කළ/ඒ.බ.ගො.භාණ්ඩාගාරික |
| 05 | එම්.සුනිල් ශාන්ත මහතා | පැරකුම් | සභාපති |
| 06 | ඩබ්.නන්දාවති මිය | නිලමහා | ලේකම් |
| 07 | එන්.පී.සමරසිංහ මහතා | පැරකුම් | භාණ්ඩාගාරික |
| 08 | එස්.එච්.ඩී.නිශාන්ති පුෂ්ප කුමාරි මිය | වෙහෙරබැදි | ලේකම් |
| 09 | ආර්.ඩබ්.නාලනි ජයතිලක මිය | ප්‍රගති | භාණ්ඩාගාරික |

| | | | |
|---|---|---|---|
| 10 | පි.ජී.සජිත් ගිහාන් මහතා. | නවෝදය | උ/ලේකම් |
| 11 | ඩබ්.ඒ.සුසිමා සෙනරත් මිය. | වෙහෙරබැදි | භාණ්ඩාගාරික |
| 12 | ආර්.ඩබ්.වසන්තා ගිතාංජලි මිය. | නිලමහා | සාමාජික |

**1.2018/19 මහ කන්නයේ වගාවේ ප්‍රගතිය.**

**01.01.කන්නය පිළිබඳව ගොවි සංවිධානවල අදහස් දැක්වීම**

| ගොවි සංවිධානය | වී අස්වනු නෙලා ඇති ප්‍රමාණය | වි අස්වනු නෙලිමට ඇති ප්‍රමාණය | අතිරේඛ බෝග වගාව |
|---|---|---|---|
| නීලමහා | අක්කර 1½ | අක්කර 90½ | අක්කර 12 |
| ප්‍රගති | අක්කර 1½ | අක්කර 53½ | අක්කර 06 |
| නවෝදය | අක්කර 10 | අක්කර 125 | අක්කර 70 |
| වෙහෙරබැදි | අක්කර 1½ | අක්කර 51 | අක්කර 12 |
| පැරකුම් | අක්කර 01 | අක්කර 263 | අක්කර 10 |
| නීලවැලි | අක්කර 02 | අක්කර 498 | |

**01.02.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම.**

**මුලස්ථාන කෘෂිකර්ම උපදේශක- එම්.ආර්.අයි.අබේරත්න මහතා.**

- යූ.එන්.ඩී.බී වැඩසටහන යටතේ රටකජු හා උඳු බීජ නිෂ්පාදනයට පමණක් හා තුඹ කරවිල නිෂ්පාදනයට කැමති ගොවීන්ගේ නාම ලේඛනය ලබා දීමට කටයුතු කරන ලෙස දන්වන ලදි.

**01.03.වාරිමාර්ග දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම-**

**ඉංජිනේරු සහාකාර - ඩී.ඩී.එම්.රත්නායක මිය.**

- ජලජ ශාඛ ඉවත් කිරිමට හා කැලය ඉවත් කිරිමට ශ්‍රමදාන සඳහා සහය දුන් ගොවි සං.විධාන වලට හා නිලධාරින්ට ස්තුතිය පුද කරන බවත් ඉතිරි ප්‍රමාණය ද ඉවත් කර දෙන ලෙස පෙන්වා දෙන ලදි.
- ප්‍රධාන ඇලේ මැණුම් කටයුතු සිදු කළ යුතු බවත් ඒ සඳහා 2019/02/15 වන දින සිට දින 05 ඇල වැසීමට සිදුවන බවත් ඉදිරියේ දි සෑම මසකම ජලජ පැලෑටි ඉවත් කිරිම සඳහා දින 05 වැසීමට අවශය කටයුතු කිරිමට කමිටුවේ තිරණයක් අවශ්‍ය බව පෙන්වා දෙන ලදි.
- JCB යන්ත්‍රය ලබා දී ඇති අතර තව දින 03 ක් පමණක් ලබා දිය හැකි බව දැනුවත් කරන ලදි.
- ප්‍රධාන ඇලේ රක්ෂිත වෙන් කිරිමට සුදුසු දිනයක් යොදා ගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදි.

**01.04.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම-**

**ප්‍රාදේශිය සංවර්ධන නිලධාරි - කේ.ජී.එල්.ප්‍රියදර්ශණි මිය.**

- වගා හානිය සම්බන්ධව දැනුවත් කරන ලදි එහි දි වී වගාව සඳහා පොහොර සහානාධාරය ලබා ගත් ගොවින් සඳහා ගංවතුර/නියගය/වල් අලි හානි සඳහා වන්දි ලබා ගත හැකි අතර අක්කරයට රුපියල් 40000/= ක උපරිමයකට යටත් ව බව පෙන්වා දෙන ලදි.
  සේනා දළඹුවා පිළිබඳව දිප ව්‍යාප්ත වැඩසටහනක් පවතින අතර ඒ පිළිබඳව දැනුවත් කරන ලදි.
- පළිබෝධ හානිය පිළිබඳ කමිටුවක් පිහිටුවා ඇති බවත් ඒ පිලිබඳව ද දැනුවත් කරන ලදි.
- ගිනි අවි ලබා ගැනිම පිලිබඳව ද දැනුවත් කරන ලදි.
- කුඹුරු ඉඩම් වල පොල් වගා කළ නොහැකි බව පෙන්වා දෙන ලදි.
- කාන්තා ගොවි සංවිධාන පිළිබඩවද දැනුවත් කරන ලදි.
- ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පවත් වන පොල පිළිබඳව ද අදහස් ප්‍රකාශ කරන ලදි.
- වී මිලදී ගැනීම පිළිබඳව ද දැණුවත් කරන ලදි.
- නිලබැමම ව්‍යාපාරයේ ගොවි සංවිධාන සඳහා පොහොර අක්කර 1009 ක් සඳහා නිකුත් කර ඇති බව පෙන්වා දෙන ලදි.
- වගා නොකළ ඉඩම් සම්බන්ධව ගොවිජන සංවර්ධන පනත අනුව ක්‍රියාත්මක කළ හැකි බව පෙන්වා දෙන ලදි.

**01.04.පොල් සංවර්ධන මණ්ඩලය අදහස් දැක්වීම-**

**පොල් සංවර්ධන නිලධාරි - ඩී.ඩබ්.ගයාන් රචිත සමරවිර මහතා.**

- පැමිණි මුල්ම දිනය බව පෙන්වා දෙන ලදි.
- පොල් පැල සහනාධාර යටතේ පොල් පැලයක් සඳහා රුපියල් 50/=ක් බැගින් ලබා දිය හැකි බවත් පොල් වගාව යටතේ අතුරු බොග වගා කරන්නේ නම් කෙසෙල්/අන්නාසි/පැපොල් වගා කරන ගොවින් සඳහා අක්කරයට රුපියල් 15000/= ක් ලබා දිය හැකි බවත් කහා,ඉඟුරු සඳහා අක්කරයට රුපියල් 10000/= ක් ලබා දිය හැකි බව පෙන්වා දෙන ලදි.

- ❖ පොල් වගාවේ අස්වනු වැඩි කිරිම සඳහා කාබනික පොහොර යෙදිමට/කාණු කැපිමට/අස්නු දැම්ම සඳහා එක් ගසකට රුපියල් 125/= ක් ලබා දිය හැකි බව පෙන්වා දෙන ලදි.
- ❖ වගා ආරක්ෂණ ක්‍රම සඳහා අක්කර එකකට යටත් ව එක් ගසකට රුපියල් 200/=ක් ගෙවිමට හැකි බව පෙන්වා දෙන ලදි.
- ❖ පොල් වගාවේ පැළ සිටුවිමට රුපියල් 30 ක සහන මිලට හා ගෙවතු වගා යටතේ පැල 02 ක් පමණක් රුපියල් 30/= මිලට ලබා දිය හැකි බව පෙන්වා දෙන ලදි.
- ❖ මයිටා රෝගය සඳහා මයිටා පැකට් එක හා පාම් ඔයිල් මිශ්‍රණය පාවිච්චි කළ හැකි බව පෙන්වා දෙන ලදි.
- ❖ කිරි ගවයන් දෙදෙනකු ලබා දෙන වැඩසටහනක් ඉදිරියේ දි පවතින බව පෙන්වා දෙන ලදි.

**02.01 ආයතන සංවර්ධන කටයුතු.**

**සංවර්ධන නිලධාරි-ආර්.සී.එස්.කේ.සෙනෙවිරත්න මහතා.**

<u>කාරක සභා මහා සභා හා නිලවරණ පැවැත්විමේ ප්‍රගතිය.</u>

| ගොවි සංවිධානය | නිලවරණ පැවැත්විම | මහා සභා පැවැත්විම | කාරක සභා පැවැත්විම |
|---|---|---|---|
| නීලමහා | - | 01 | 01 |
| ප්‍රගති | - | 01 | - |
| නවෝදය | - | 01 | - |
| වෙහෙරබැදි | - | 01 | - |
| පැරකුම් | - | 02 | - |
| නීලවැලි | - | | 01 |
| එකතුව | - | 06 | 02 |

**02.02. පුහුණු හා දැනුවත් කිරිම.**

**නේවාසික ව්‍යාපාර කළමනාකරු- එච්.එම්.දිසානායක මහතා.**

- ❖ හොඳම ගොවි සංවිධානය තේරිමේ වැඩසටහන පිළිබඳව දැනුවත් කළ අතර 2019.02.21 හා 22 වන දින පැවැත්විමට කටයුතු සුදානම් කරන බව පෙන්වා දෙන ලදි.
- ❖ පැරකුම්/නීලවැලි ගොවි සංවිධාන වල විගණනය 2019/02/21 වන දින සිදු කරන බව පෙන්වා දෙන ලදි.
- ❖ 2019 මාර්තු 07 වන දින පෙර කන්න රැස්විම පැවැත්වන බව පෙන්වා දෙන ලදි.

**03. නිරන්තර නඩත්තු වැඩසටහන.**

- ❖ පැරකුම් /නීලවැලි ගොවි සංවිධානය තුල රක්ෂිත වෙන් නොකල ඇලවල් වල රක්ෂිත වෙන් කිරිම සිදු කල යුතු බව පෙන්වා දෙන ලදි.

- ❖ 2019 මාර්තු 22 ලෝක ජල දිනය පිළිබඳව ද පිළිබඳව දැනුවත් කරන ලදි.එම වැඩසටහන යටතේ යෝධ ඇලේ ශ්‍රම දානය වැඩසටහන/රුක් රෝපණ වැඩසටහන/වාරි මිතුරු සමාජ වැඩසටහන් පිළිබඳව දැනුවත් කරන ලදි.

- ❖ වගා නොකල ඉඩම් ගැටළුව සම්බන්ධව ප්‍රාදේශී ලේකම් තුමා දැනුවත් කර වගා කිරීම සඳහා පමණක් ඉඩම් ලබා ගැනීම ඉල්ලීම් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

**04.ලිපි පිළිබඳව දැනුවත් කිරීම.**

**නේවාසික ව්‍යාපාර කළමනාකරු- එච්.එම්.දිසානායක මහතා.**

මෙතෙක් ගොවි සංවිධාන වල සාමාජිකත්වය ලබා ගෙන නොමැති ඉඩම් කට්ටිකරුවන් අදාල ගොවි සංවිධාන වල සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා යවන ලිපිය සකසා ඇති බවත් එකී කට්ටිකරුවන්ගේ ලිපිනයන් කඩිනමින් කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටින ලදි.

**05.වෙනත් වැඩසටහන් හා දැනුවත් කිරීම.**

**නේවාසික ව්‍යාපාර කළමනාකරු- එච්.එම්.දිසානායක මහතා.**

- ❖ 2019 යල් කන්නය සඳහා රටකජු බීජ/සෝයා/තල බීජ ගෙන්වීමට කටයුතු සූදානම් කර ඇති බව පෙන්වා දුන් අතර මෙම කන්නයේ දී බීජ ලබා දෙන අවස්ථාවේ දී බීජ වටිනා කමින් 25% ක් අයකණ අතර ඉතිරි 75% ක බීජ වල වටිනාකම අස්වනු අලවි කිරීමේ දී ලබා දිය යුතු බවත් එම මුදල් එකාබද්ධ ගොවි සංවිධානය ගිණුම තුළ අරමුදලක් වශයෙන් තබන අතර නැවත බීජ ලබා ගන්නා අවස්ථාවේ දී නැවත නැවත මෙම ක්‍රමයට එම ගොවින් හට බීජ ලබා ගන්නා අවස්ථාවේ දී ප්‍රයෝජනයට ගත හැකි බව පෙන්වා දෙන ලදි.

- ❖ **සී/බී/එල්** ආයතනය සමඟ ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ මන්චි කොමේ බිස්කට් නිෂ්පාදනය සඳහා ඔට්ටුපල්ලම කුඹුරු යාය තුළ වගා කළ අක්කර 05 අස්වැන්න සාර්ථක බවත් ඉදිරියේ තවදුරටත් වී වගාව ව්‍යාප්ත කළ හැකි බවත් පෙන්වා දෙන ලදි.

- ❖ වෙහෙරබැදි ගොවි සංවිධානය ආදර්ශ ගොවි සංවිධානයක් බවට පත් කිරීමට කටයුතු සූදානම් කරගන යන අතර ඒ සඳහා කහා වගාව ආදර්ශන වගාවක් වශයෙන් ව්‍යාප්ත කිරීමට කටයුතු සූදානම් කරමින් පවතින බව පෙන්වා දෙන ලදි.

- ❖ සෝයා වගාව පිලිබඳව සාකච්ඡා කර ඇත්තේ කමිටුව දැනුවත් කර කමිටුවේ අනුමැතිය ඇතිව බව පෙන්වා දෙන ලදි.

- ❖ ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ නීලබැම්ම ව්‍යාපාරයේ පළමු වතාවට අත්හදා බැලීමක් වශයෙන් ගස්ලබු අක්කර 10 ක් හා කොමඩු අක්කර 05 ක් වගා කිරීමට සූදානම් කර ඇති අතර එහි දී ගස්ලබු කිලෝග්‍රෑම් 01 ක් රුපියල් 45/= ක මිලකටත් කොමුඩු කිලෝග්‍රෑම් 01 ක් රුපියල් 35/= ක මිලකටත් ගිවිසුම් ගත වීමට කටයුතු සූදානම් කර ඇති බවත් අස්වැන්නෙන් අයකර ගැනීමේ පදනම මත අවශ්‍ය බීජ ලබා දීමටත් තිරණය කරගන ඇති අතර මෙවැනි ගිවිසුම් යටතේ ගොවියාගේ එළවළු/පලතුරු /වී/ දිගින් දිගටම ස්ථාවර මිලක් යටතේ අලවි කිරීමට හැකි වීම ඉතා හොඳ තත්වයක් බව පෙන්වා දෙන ලදි.

## 06. ගොවි සංවිධාන අදහස් දැක්වීම.

- **ප්‍රගති ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික-ආර්.ඩබ්.නාලනි ජයතිලක මිය** - ප්‍රගති ගොවි සංවිධානයේ දකුණු ඉවුරේ රක්ෂිත ඉවත් කර ගැනීමට අවශ්‍ය බවත් දකුණු ඉවරේ වාරි පාර කි.මි 1.2 ප්‍රමාණයක් පිළිසකර කළ බව පෙන්වා දෙන ලදි.

- **නවෝදය ගොවි සංවිධානයේ උප ලේකම් -පි.ජී.සජිත් ගිහාන් මහතා** - මෙම ව්‍යාපාර ආරම්භ කළ කාලයේ සිට කැමට පොල් ගස් 05 ක් පමණක් සිටුවීමට සීමාකර තිබූ අතර එහෙත් යම් යම් අය පොල් වගා කර ඇති බවත් ඒ නිසා පවතින නීති වෙනස් නොකර ක්‍රියාත්මක කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

- **නවෝදය ගොවි සංවිධානයේ ලේකම් -පි.ඩී.ජේ.පතිරාජ මහතා**- යෝධ ඇලේ කැළය ඉවත් කිරීම පිළිබඳව කරුණු ඉදිරිපත් කළ අතර කොන්ත්‍රාත් පදනම කැලය කපීම සිදු කළ බවත් ඒ සඳහා රුපියල් 40000/= ක් වියදම් වූ බවත් වන අලි ගැටළුව තදින් පවතින බවත් එකාබද්ධ ගොවි සංවිධානය මගින් අලි වෙඩි 75 ලැබුණු බවත් වාරිමාර්ග මගින් ජේසීබී යන්ත්‍රය ලබා දීම පිළිබඳව ස්තූතිය පුදකරන බවත් එම පාර පිළිසකර කිරීමට රුපියල් 22500/= වියදම් වූ බව පෙන්වා දෙන ලදි.

- **නීලමහා ගොවි සංවිධානයේ ලේකම් -එන්.පි.නන්දාවති මිය** - තම ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ වාරිමාර්ග ජේසීබී යන්ත්‍රය යොදා ගනිමින් කාණු පද්ධති කිපයක් සකස් කළ බවත් ඒ සඳහා ගොවි සංවිධානයේ ඇතැම් අය විරුද්ධ වීම නිසා නතර කළ බවත් යන්ත්‍රය ලබා දීම සම්බන්ධව ස්තූතිය පුද කරන බව පෙන්වා දෙන ලදි.

- **වෙහෙරබැදි ගොවි සංවිධානයේ සභාපති - ඩබ්.ටී.එන්.කපුරුබංඩා මහතා** - අපවහන ඇල සම්බන්ධ ගැටළුව නිරාකරණය කර දීම සම්බන්ධව කළමනාකරණ තුමාට ස්තූතිය පුද කරන අතර කමිටුව මගින් ගත් තීරණය පරිදි 2019/02/07 වන දින ශ්‍රමදානය ගොවි සංවිධාන මගින් සිදු නොකලේ මන්ද යන්න ප්‍රශ්න කරන ලදි.

- **නීලවැලි ගොවි සංවිධානයේ ලේකම් - ඩී.එම්.සෙනවිරත්න මහතා** -
  - රං කරල් නෙලා සිදු කරන කිරි ඉතුරුම් මංගල්‍ය සිදු කල බව පෙන්වා දෙන ලදි.
  - ඔට්ටුපල්ලම යායට යාමට ඇති පාර කිලෝමීටර් 04 ක් සකස් කළ බවත් ඒ සඳහා රුපියල් 30000/= ක් පමණ වියදම් වූ බව පෙන්වා දෙන ලදි.
  - අලි ගැටළුව ඉතා තදින් පවතින බවත් නේවාසික ව්‍යාපාර කළමනාකාර තුමාගේ මැදිහත් වීම මත අලි වෙඩි 300 ක් ඒකාබද්ධ ගොවි සංවිධානට ලැබුණු බව පෙන්වා දෙන ලදි.
  - ප්‍රදේශයේ ව්‍යාපාර තුළ පවතින මත් ද්‍රව්‍ය පිළිබඳව ද කරුණු ඉදිරිපත් කළ අතර වෙනත් සමාජය විනාශ කරන ක්‍රියාකාරකම් ද ව්‍යාපාරයේ සිදුවන බව පෙන්වා දෙන ලදි.
  - ඒකාබද්ධ ගොවි සංවිධාන සෑම ගොවි සංවිධානයක් වෙනුවෙන්ම කටයුතු කරන බව පෙන්වා දෙන ලදි.
  - ඇල ශුද්ධ කිරීම පිළිබඳව දැන්වීම් අලවා ඇති බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින්ද කම්කරුවන් යොදා ඇල ශුද්ධ කළ යුතු බව පෙන්වා දෙන ලදි.
  - ගොවි සංවිධාන නිලධාරි මගින් ව්‍යාපාරය තුළ සිදු කරන සියළුම දේ පිළිබඳව ඒකාබද්ධ සභාපති වරයා දැනුවත් කරන ලෙස ඉල්ලීම් කරන ලදි.

❖ **පැරකුම් ගොවි සංවිධානයේ සභාපති - එම්.සුනිල් ශාන්ත මහතා -**

- පෙබරවාර මස 20 දක්වා ජලය අවශ්‍ය බව පෙන්වා දෙන ලදි.
- ඇලේ ජලජ පැලෑටි ඉවත් කිරිමේ ශ්‍රමදානය සඳහා පැරකුම් ගොවි සංවිධානයේ ගොවින් 65 ක් පමණ සහාභාගි වු බවත් ඇලේ කැලය ඉවත් කිරිමේ දි ගොවි සංවිධානයට නොමැති අය කැලය ඉවත් නොකිරිම ගැටළුවක් බව පෙන්වා දෙන ලදි.

**07.කමිටුවේ විශේෂ තිරණ.**

❖ ගෙවතු වගා සඳහා පමණක් පොල් සංවර්ධන මණ්ඩලය සහය ලබා ගැනිමට කමිටුව විසින් තිරණය වු අතර කෘෂිකර්ම කමිටුව වෙත ද මෙම ප්‍රශ්නය යොමු කරන බව පෙන්වා දෙන ලදි.

❖ ප්‍රගති ගොවි සංවිධානයේ අනවසර වගා කරණ පුද්ගලයා සඳහා ලිපියක් මගින් දැන්විමට සුදුසු බව තිරණය විය.

❖ ප්‍රධාන ඇලේ නඩත්තු කටයුතු සඳහා වාරිමාර්ග නඩත්තු අරමුදල ගොවි සංවිධාන 06 ට බෙදා දිමට හා එම කටයුතු හරියාකාරව සිදු කිරිමට සියළුම ගොවි සංවිධාන එකඟ විය.

❖ මින් ඉදිරියට සෑම මසක 15 වන දින සිට 20 වන දින දක්වා ප්‍රධාන ඇල වැසිමට සියළුම ගොවි සංවිධාන එක මතිකව තිරණය කරන ලදි.

**<u>ස්තුති කථාව .</u>**

**එකාබද්ධ ගො.සංවිධානයේ ගරු ලේකම් - පි. ඩි.ජේ.පතිරාජ මහතා.**

පැමිණි රාජ්‍ය නිලධාරින්ට මෙන්ම ගොවි සංවිධාන වල නිළධාරින්ට හා සාමාජික මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන ලදි. ඒ අනුව න්‍යාය පත්‍රයට අදාලව සාකච්ඡා කල කරුණු නිමවුයෙන් ප:ව 12.30 ට පමණ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්විම නිමා විය.

.................................

එච්.එම්. දිසානායක
නේවාසික ව්‍යාපාර කළමනාකරු(වැ.බ)
නීලබැම්ම ව්‍යාපාරය.

එච්.එම්. දිසානායක
නේවාසික ව්‍යාපාර කළමනාකරු (වැ.බ.)
නීලබැම්ම ව්‍යාපාරය,
සාලියවැව හන්දිය.

පිටපත් :- 1.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය (කා.දැ.පි)
2.දිස්ත්‍රික් ලේකම් - පුත්තලම (කා.දැ.පි)
3. ප්‍රාදේශීය ලේකම් කරුවලගස්වැව (කා.දැ.පි)
4.වාරිමාර්ග අධ්‍යක්ෂ පුත්තලම (කා.දැ.පි)
5. නියෝජ්‍ය කෘ. අධ්‍යක්ෂ අ.ප.කාර්යාලය අනුරාධපුරය (කා.දැ.පි)
6.වාරිමාර්ග ඉංජිනේරු පුත්තලම (කා.දැ.පි)
7.ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී සාලියවැව (කා.දැ.පි)
8.මූලස්ථාන කෘෂිකර්ම උපදේශක (කා.දැ.පි)